සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ අවසාන ඇගයීම - 2012

11 - ශ්‍රේණිය

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

නම / විභාග අංකය : .... කාලය පැය 01 යි

සැලකිය යුතුයි.

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා සඳහන් කරන්න.

01. ව්‍යාපාර ඇතිවීමට මූලිකවම බලපාන හේතුව වන්නේ
1. චක්‍ර නිෂ්පාදනය බිහිවීමයි
2. අවශ්‍යතා සපුරා ගැනීමට විවිධ වුවමනා තෘප්තිමත් කළ යුතු වීමයි
3. විශේෂීකරණය අනුව ගුණාත්මක නිෂ්පාදිත බිහි වීමයි
4. අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම ව්‍යාපාරික කාර්යයක් වීමයි

02. මහා පරිමාණ නිෂ්පාදනය ඇති වීමට හේතු වූ කරුණු යුගලය ඇතුලත් කාණ්ඩය වන්නේ
1. කාර්ය විශේෂීකරණය හා යන්ත්‍ර සූත්‍ර භාවිතය
2. යන්ත්‍ර සූත්‍ර භාවිතය හා උපකාරක සේවාවල දියුණුව
3. මුදල් භාවිතය හා ජාත්‍යන්තර වෙළඳාම
4. විශේෂ ප්‍රාගුණ්‍යය හා මුදල් භාවිතය

03. පහත දැක්වෙන වගුවේ X තීරුවේ ව්‍යාපාර පරිසර වර්ගීකරණයන් Y තීරුවේ ඒට අදාළ පරිසර සාධකයන් දක්වා ඇත.

X තීරුව	Y තීරුව
A. සූක්ෂම පරිසරය	1. සේවකයෝ
B. සාර්ව පරිසරය	2. ආර්ථික පරිසරය
	3. කළමනාකරුවන්
	4. දේශපාලන හා නෛතික පරිසරය

X හා Y තීරුවල දැක්වෙන පද නිවැරදිව ගලපා ඇති කාණ්ඩය වන්නේ,
1. A - 1 හා 2, B - 3 හා 4
2. A - 2 හා 3, B - 1 හා 4
3. A - 1 හා 3, B - 2 හා 4
4. A - 2 හා 4, B - 2 හා 3

04. පෞද්ගලික අංශයට අයත් ශුභසාධනය අරමුණු කරගත් ව්‍යාපාර වර්ග දැක්වෙන පිළිතුර තෝරන්න.

A සමුපකාර B රාජ්‍ය සමාගම් C පොදු සමාගම් D සමිති ව්‍යාපාර

1. AB
2. ABC
3. BD
4. AD

05. කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා බලපත්‍රයක් ලබාගත යුත්තේ,
1. සෞඛ්‍ය අමාත්‍යාංශයෙනි
2. මධ්‍යම පරිසර අධිකාරියෙනි
3. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙනි
4. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙනි

06. ව්‍යාපාර ආරම්භ කිරීමේදී මූලිකව ඉටු කළ යුතු කාර්යය ලෙස සැලකිය හැක්කේ
1. ව්‍යාපාරය ස්ථානගත කිරීමට සුදුසු කටයුතු යෙදීමයි
2. අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමයි
3. පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සොයා බැලීමයි
4. වෙළඳපල අධ්‍යනයක් කර සැලැස්මක් පිළියෙල කිරීමයි

07. පහත "අ" ශීර්ෂය යටතේ දක්වා ඇති වත්කම් වර්ගයට "ආ" ශීර්ෂය යටතේ ඇති වත්කම් ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ.

"අ"	"ආ"
E ජංගම වත්කම්	A. යන්ත්‍ර උපකරණ
F ස්ථාවර වත්කම්	B. බඩු තොග
	C. මෝටර් රථ
	D. බැංකුවේ ඉතිරි මුදල

පිළිතුරු
1. F-AC, E-BD
2. E-AC, F-BD
3. F-BC, E-AD
4. E-BC, F-AD

08. අලෙවි සැලැස්මක් පිළියෙල කිරීම සම්බන්ධයෙන් අදාළ නොවන ප්‍රකාශය මින් කවරක්ද?
1. අලෙවි සැලැස්ම සකස් කිරීමෙන් ව්‍යාපාරයේ අපේක්ෂිත ලාභය හෝ අපේක්ෂිත අතිරික්තය දැනගත හැකිය.
2. අපේක්ෂිත නිෂ්පාදිතය පිළිබඳ වෙළඳපල අධ්‍යයනයක් කර සැලැස්ම සකස් කළ යුතුයි.
3. ඇස්තමේන්තු කරන ලද විකුණුම් ආදායම, ලාභය දැනගත හැකියි.
4. ඒකකයක විකුණුම් මිලෙන් නිපදවූ ඒකක ගණන වැඩිකර මුළු විකුණුම් ආදායම දැනගත හැකියි.

09. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බැංකු වර්ග කීපයක් පහත දක්වා ඇති අතර, තැන්පතු භාරගන්නා ආයතන ඇතුළත් කාණ්ඩය තෝරන්න.
1. වාණිජ බැංකු / ඉතිරිකිරීමේ බැංකු / සංවර්ධන බැංකු
2. වාණිජ බැංකු / වණික් බැංකු / ඉතිරිකිරීමේ බැංකු
3. සංවර්ධන බැංකු / වණික් බැංකු / වාණිජ බැංකු
4. වාණිජ බැංකු / මූල්‍ය සමාගම් / වණික් බැංකු

10. ඇතැම් චෙක්පත් වල වලංගු කාලය සඳහන් වී ඇත. එසේ වලංගු කාලයක් සඳහන් නොවන්නේ නම් සාමාන්‍යයෙන් චෙක්පතක වලංගු කාලය වන්නේ,
1. මාස 03 කි.
2. දින 60 කි.
3. මාස 06 කි.
4. දින 90 කි.

11. විවිධ බැංකු අතරින් වාණිජ බැංකුවක් වෙන්කර හඳුනාගත හැකි ලක්ෂණයක් ලෙස ගත හැක්කේ
1. හරපත්, ණයපත් ආදිය මගින් ගණුදෙනු කිරීමේ සේවා සැපයීමයි.
2. විදේශ විනිමය ගණුදෙණු ආශ්‍රිත සේවා සැපයීමයි.
3. දිගු කාලීන හා කෙටි කාලීන ණය පහසුකම් සැපයීමයි.
4. ඉතිරි කිරීමේ හා ස්ථාවර තැන්පත් පවත්වාගෙන යාමයි.

12. අප්පුහාමි සිය ජීවිතය සඳහා ලබාගත් රු. ලක්ෂ 5ක් වටිනා ජීවිත රක්ෂණ ඔප්පුව වසර 10කින් කල් පිරීමට නියමිතය. වසර දෙකක් වාරික ගෙවූ පසු අප්පුහාමි මියගිය අතර, ඔහුගේ පුතුන් දෙදෙනා වන්දි මුදල ලබා ගැනීමට ඉදිරිපත් විය. මෙම සිදුවීම පිළිබඳව පහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. වන්දි මුදල ලෙස රු. ලක්ෂ 5 ක් ලැබේ.
2. වසර 2 තුළ ගෙවූ මුදල පමණක් ලැබේ.
3. කල්පිරී නොමැති නිසා වන්දි මුදල හිමිනොවේ.
4. රු. ලක්ෂ 5 ලබා දීමෙන් හානිපූර්ණ මූලධර්මය කඩ වේ.

13. සන්නිවේදන ක්‍රියාවලියක ඇතුළත් උපාංග නිවැරදි ලෙස ගලපා ඇති පිළිතුර තෝරන්න.
   1. ප්‍රතිචාරය → මාධ්‍යය → ලබන්නා → පණිවුඩය
   2. මාධ්‍යය → පණිවුඩය → යවන්නා → ලබන්නා → ප්‍රතිචාර
   3. යවන්නා → පණිවුඩය → මාධ්‍යය → ලබන්නා → ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණය
   4. පණිවුඩය → මාධ්‍යය → ලබන්නා → ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණය

14. වෑන් රථයක් සහ ත්‍රිරෝද රථයක් හිමි සිරිමෙවන් අද දින වෑන් රථය නැවතුම් පළකට යොමුකර ත්‍රිරෝද රථයෙන් සිය නිෂ්පාදිත වූ තුනපහ කුඩු පැකට් ප්‍රවාහනය කරයි. මහා මාර්ග පමණක් නොව පටු මාර්ගද යොදාගෙන භාණ්ඩ බෙදා හැරීමෙන් ඔහුගේ කාලයද ඉතිරි විය.

   මෙහි සඳහන් ප්‍රවාහන මූලිකාංග සිද්ධිය අනුව පිළිවෙළින් ගැලපූ විට පිළිතුර වන්නේ,

   1. මාධ්‍යය, පර්යන්ත, බලය
   2. මාධ්‍යය, මාර්ග, පර්යන්ත
   3. මාධ්‍යය, පර්යන්ත, මාර්ග
   4. මාර්ග, මාධ්‍යය, පර්යන්ත

15. ව්‍යාපාර විසින් යහපත් ගබඩාකරණ ක්‍රියාවලියක් පවත්වා ගැනීමට උනන්දු වන්නේ,
   1. භාණ්ඩ ඉල්ලුම වැඩි වන නිසාය
   2. භාණ්ඩ වල ගුණාත්මක බව ඉහළ යාම නිසාය
   3. වෙළඳසැල ජනප්‍රිය වන නිසාය
   4. ඉල්ලුමට සරිලන සැපයුමක් පවත්වාගත හැකි නිසාය

16. ශ්‍රී ලංකා මහ බැංකුව දළ ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමේදී නිෂ්පාදනය බෙදා ඇති ආකාරය වන්නේ,
   1. ප්‍රාථමික නිෂ්පාදනය, ද්විතියික නිෂ්පාදනය, තෘතියික නිෂ්පාදනය
   2. ඍජු නිෂ්පාදනය, වක්‍ර නිෂ්පාදනය, සුළු පරිමාණ නිෂ්පාදනය
   3. කෘෂිකාර්මික නිෂ්පාදනය, කාර්මික නිෂ්පාදනය, සේවා නිෂ්පාදනය
   4. සුළු පරිමාණ නිෂ්පාදනය, මහා පරිමාණ නිෂ්පාදනය, ගෘහ නිෂ්පාදනය

17. යම් නිශ්චිත කාල සීමාවක් තුළදී ව්‍යාපාරයේ අයහාර ප්‍රතිඵලය පෙන්නුම් කිරීම සඳහා පිළියෙළ කරනු ලබන්නේ,
   1. මුදල් ප්‍රවාහ ප්‍රකාශයයි
   2. ශේෂ පත්‍රයයි
   3. ආදායම් ප්‍රකාශයයි
   4. ලාභාලාභ ගිණුමයි

18. ව්‍යාපාරයකට අරමුදල් සම්පාදනය කර ගැනීමේදී අවධානය යොමු කළයුතු ප්‍රධානම කරුණ වන්නේ,
   1. අරමුදල් ලබා ගැනීමේ වියදම සහ ගෙවිය යුතු පොලිය
   2. ඇප සුරකුම් වල අවශ්‍යතාවය
   3. ඉක්මනින් ලබාගත හැකි මාර්ගයක් වීම
   4. කොටස් වෙළඳපලේ පවතින මිල ගණන්

19. ඔබ සතුව රු. 1,000,000/- ක මුදලක් ඇතැයි සිතන්න. මෙම මුදල ආයෝජනය කිරීමේදී ඔබ අවධානය යොමු කරන වැදගත්ම කරුණු යුගලය අයත් කාණ්ඩය තෝරන්න.
   1. අවදානම හා සුරක්ෂිතභාවය
   2. වගකීම හා විශ්වාසවන්තභාවය
   3. මහජන පිළිගැනීම හා නීත්‍යානුකූලභාවය
   4. අවදානම හා ප්‍රතිලාභ

20. පහත සඳහන් ආයෝජන මාර්ග අතුරින් විධිමත් කෙටි කාලීන ආයෝජන මාර්ගයක් වනුයේ,
   1. භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම
   2. ඉඩම් හා දේපළ මිලදී ගැනීම
   3. භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම
   4. ස්වර්ණාභරණ උකස් තැබීම

ප්‍රශ්න අංක 21 සිට 28 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත සිද්ධිය උපයෝගි කරගන්න.

2012.01.01 සුගත් විසින් රු. 50,000/- ක් යොදා සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කළේය. බැංකුවෙන් රු. 25,000/- ක ණය මුදලක්ද ලබා ගත් අතර රු. 25,000/- ක් ගෙවා කඩ කාමරයක් මිලට ගන්නා ලදී. පළමු සතිය තුළ ඔහුගේ ව්‍යාපාරයේ ගණුදෙනු මෙසේය.

තොග වෙළඳසැලකින් රු. 10,000/- ක භාණ්ඩ ණයට ලබා ගත් අතර අත්පිට මුදලට රු. 20,000/- ක භාණ්ඩ ලබා ගත්තේය. මෙම සතිය තුළ සියළු භාණ්ඩ විකුණූ අතර විකුණුම් ආදායම රු. 40,000/- කි. රක්ෂණ ගාස්තු රු. 1,500/- ක් ද විදුලිය වියදම් රු. 1,000/- ක් ද ගෙවන ලදී.

21. සුගත්ගේ ව්‍යාපාරය ආරම්භයේ මූලික ගිණුම් සමීකරණය දක්වෙන පිළිතුර වන්නේ,

	ප්‍රාග්ධනය	+	වගකීම්	=	වත්කම්
1.	50,000	+	50,000	=	100,000
2.	50,000	+	25,000	=	75,000
3.	57,500	+	25,000	=	82,500
4.	75,000	+	7,500	=	82,500

22. තොග වෙළඳ සැලකින් භාණ්ඩ ණයට ලබා ගැනීම ගිණුම්ගත වන්නේ
1. මුදල් ගිණුම හර, ගැණුම් ගිණුම බැර
2. ගැණුම් ගිණුම හර, මුදල් ගිණුම බැර
3. ගැණුම් ගිණුම බැර, ණය ගැතියෝ හර
4. ගැණුම් ගිණුම හර, ණය හිමියෝ බැර

23. භාණ්ඩ අත්පිට මුදලට ලබා ගැනීම සටහන් වන මූලික පොත වන්නේ,
1. ගැණුම් පොත
2. විකුණුම් පොත
3. මුදල් පොත
4. ගැණුම් ගිණුම

24. මෙහි සඳහන් ආදායම් වියදම් අතර වෙනස
1. රු. 27,500/- කි
2. රු. 37,500/- කි
3. රු. 17,500/- කි
4. රු. 7,500/- කි

25. සුගත්ගේ ව්‍යාපාරයේ පළමු සතිය අවසානයේදී මූලික ගිණුම් සමීකරණය විය යුත්තේ,

	ප්‍රාග්ධනය	+	වගකීම්	=	වත්කම්
1.	57,500	+	35,000	=	92,500
2.	50,000	+	30,000	=	80,000
3.	50,000	+	25,000	=	75,000
4.	55,000	+	25,000	=	80,000

26. ඉහත ව්‍යාපාරයේ විදුලි වියදම් සහ රක්ෂණ වියදම් හඳුන්වන්නේ,
1. ප්‍රාග්ධන වියදම් ලෙසය
2. ප්‍රාථමික වියදම් ලෙසය
3. අයභාර වියදම් ලෙසය
4. උපචිත වියදම් ලෙසය

27. බැංකු ණයෙන් කොටසක් ගෙව්වේ නම්, එම මෙම ගණුදෙනුවට අදාළ ද්විත්ව ස්වරූපය වන්නේ,
1. බැංකුවේ මුදල් වැඩිවීම, බැංකු තැන්පතු අඩුවීම
2. බැංකු තැන්පතු වැඩිවීම, ව්‍යාපාරයේ මුදල් අඩුවීම
3. වගකීම් වැඩිවීම, මුදල් වැඩිවීම
4. වගකීම් අඩුවීම, මුදල් අඩුවීම

28. ව්‍යාපාරිකයා පෞද්ගලික ප්‍රයෝජනයට රු. 2,000/- ක් ආපසු ලබා ගත්තේ නම්, එය ගිණුම්ගත කළ යුත්තේ,
   1. මුදල් ගිණුම හර - ගැනිලි ගිණුම බැර
   2. ගැනිලි ගිණුම හර - ගැනුම් ගිණුම බැර
   3. ගැනිලි ගිණුම හර - මුදල් ගිණුම බැර
   4. ප්‍රාග්ධන ගිණුම හර - මුදල් ගිණුම බැර

29. ව්‍යාපාරයට රු. 5,000/- ක් ගෙවීමට ඇති සුනිල් නමැති ණයගැතියා මියගොස් ඇති බව දැනගත් නිසා වර්ෂය අවසානයේ මෙම මුදල් බොල් ණය ලෙස කපා හැරීමට තීරණය විය. මෙම ගණුදෙනුව සටහන් වන පොත් කට්ටලය වන්නේ,
   1. මුදල් පොත, ණයගැති ගිණුම
   2. බොල් ණය ගිණුම, පොදු ජනලය
   3. බොල් ණය ගිණුම, ණයගැති ගිණුම
   4. බොල්ණය ගිණුම, ණයගැති ගිණුම, පොදු ජ්නලය

30. පහත දක්වෙන ගිණුම් තැබීමේ වැරදිවලින් ගිණුම් පොත්වලින් නිවැරදි කළයුතු වරද තෝරන්න.
   1. ලෙජරයේ ගිණුමක ශේෂයක් ශේෂ පිරික්සුමට උපුටා නොගැනීම
   2. නියමිත අගය වෙනුවට වැරදි අගයක් ශේෂ පිරික්සුමේ සටහන් කිරීම
   3. ගිණුම් පොත්වල ශේෂය සෙවීමේදී සිදුවන වැරදි
   4. ගිණුම් ශේෂ, ශේෂ පිරික්සුමේ වැරදි පැත්තේ ලිවීම

31. ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේදී වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය ගණන් බැලීමේදී නිවැරදි ක්‍රම 2 ලෙස ගත හැක්කේ,

   A. $\dfrac{\text{වත්කමේ පිරිවැය - සුන්බුන් වටිනාකම}}{\text{ඵලදායි ජීව කාලය}}$

   B. $\dfrac{\text{වත්කමේ ගැණුම් මිල - සුන්බුන් වටිනාකම}}{\text{ඵලදායි ජීව කාලය}}$

   C. $\dfrac{\text{ක්ෂය කළහැකි අගය}}{\text{ඵලදායි ජීව කාලය}}$

   D. $\dfrac{\text{වත්කමේ වෙළඳපලේ අගය}}{\text{ඵලදායි ජීව කාලය}}$

   1. AB 2. ABC 3. AC 4. BD

32. ව්‍යාපාරයක ගිණුම් කාල පරිච්ඡේදය අවසානයේ ඉතිරි බඩු තොගය ගිණුම්ගත කරනුයේ
   1. බඩුතොග ගිණුම හර - වෙළඳ ගිණුම බැර
   2. බඩුතොග ගිණුම හර - වෙළඳ ගිණුම හර
   3. බඩුතොග ගිණුම බැර - වෙළඳ ගිණුම හර
   4. වෙළඳ ගිණුම හර - ශේෂ පත්‍රයේ වත්කම්

33 හා 34 ප්‍රශ්න වල පිළිතුරු සැපයීමේදී පහත සඳහන් සිද්ධිය අදාළ කර ගන්න.

උදය ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 100කි. එක් සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 100/- කි. 2010 (පසුගිය වර්ෂය) සඳහා සාමාජිකයන් 10 දෙනෙකු සාමාජික මුදල් ගෙවා නැත. එය 2011 වර්ෂයේදී ලැබී ඇත. 2011 වර්ෂයේදී සාමාජිකයන් 12 දෙනෙකු සාමාජික මුදල් ගෙවා නැත.

33. 2011 වර්ෂයේ ලැබීම් හා ගෙවීම් ගිණුමේ සඳහන් සාමාජික මුදල වනුයේ,
   1. රු. 8,800 කි 2. රු. 9,800 කි 3. රු. 10,000 කි 4. රු. 7,300 කි

34. 2011 වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ සඳහන් වන සාමාජික මුදල වනුයේ,
   1. රු. 8,700 කි 2. රු. 10,000 කි 3. රු. 9,900 කි 4. රු. 9,000 කි

පහත සඳහන් තොරතුරු උපයෝගි කර ගනිමින් අංක 35 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2012.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

	හර (රු.)	බැර (රු.)
ගැනුම්	65,000	
විකුණුම්		102,500
ගෙනල්මේ කුළී	1,500	
තොගය 2011.04.01 දිනට	10,000	
ගෙවල් කුලී	8,000	
රක්ෂණ ගාස්තු	1,500	
ආපසු එවුම්	2,200	
ආපසු යැවුම්		2,500
12% බැංකු ණය		60,000
ණය ගැතියෝ	15,000	
ණය හිමියෝ		10,000
මෝටර් රථය (පිරිවැයට)	150,000	
අතැති මුදල්	11,800	
ප්‍රාග්ධනය		90,000
	265,000	265,000

අමතර තොරතුරු

2012.03.31 දිනට ඉතිරි තොගය රු. 12,000
ගෙවිය යුතු ගෙවල් කුලී රු. 400
මෝටර් රථය පිරිවැයෙන් 10% ක් ක්ෂය කළ යුතුය
බැංකු ණය ලබාගෙන ඇත්තේ 2011.09.30 දිනය

35. සපුමල්ගේ ව්‍යාපාරයේ 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණූ බඩුවල පිරිවැය වන්නේ
1. රු. 60,000 යි
2. රු. 62,000 යි.
3. රු. 74,000 යි
4. රු. 76,500 යි.

36. මෙම ව්‍යාපාරයේ 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය වන්නේ,
1. රු. 40,200 යි
2. රු. 62,000 යි
3. රු. 38,300 යි
4. රු. 38,800 යි

37. මෙම ව්‍යාපාරයේ පිළියෙල කරනු ලබන ලාභාලාභ ගිණුමේ දැක්වෙන බැංකු පොළිය වන්නේ
1. රු. 4,000 යි
2. රු. 7,800 යි
3. රු. 7,200 යි
4. රු. 3,600 යි

38. මෙම ව්‍යාපාරයේ ශේෂ පත්‍රයේ ජංගම නොවන වගකීම් ලෙස දැක්විය යුත්තේ,
1. අතැති මුදල්
2. ගෙවිය යුතු ගෙවල් කුලී
3. ණය හිමියෝ
4. 12% බැංකු ණය

39. මෙම ව්‍යාපාරයේ ශේෂ පත්‍රයේ ජංගම වගකීම් වල එකතු විය යුත්තේ
1. රු. 14.000 යි
2. රු. 13,600 යි
3. රු. 10,400 යි
4. රු. 10,000 යි

40. මෙම ව්‍යාපාරයේ ශේෂ පත්‍රයේ දැක්වෙන ජංගම වත්කම් වල එකතුව වන්නේ
1. රු. 27,000 යි
2. රු. 38,800 යි
3. රු. 26,800 යි
4. රු. 38,000 යි

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ අවසාන ඇගයීම - 2012

11 - ශ්‍රේණිය

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

නම / විභාග අංකය : .... කාලය පැය 02 යි

වැදගත් :- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව "අ" කොටසින් ප්‍රශ්න දෙකක්ද "ආ" කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

1. සුමනවීර සංස්ථා ලිපිකරුවෙක් ලෙස සේවය කොට වයස අවුරුදු 55න් විශ්‍රාම ලැබූ නිසා රුපියල් ලක්ෂ 10ක අර්ථසාධක අරමුදල් හිමිකමක් ලැබුණි. මේ මුදලින් කොටසක් කිසියම් ව්‍යාපාර කටයුත්තක ආයෝජනය කිරීමට ඔහු තීරණය කරයි.

සුමනවීර සිය රැකියාව තුළින් ලැබූ අත්දැකීම්ද, වර්තමාන වෙළඳපල අවශ්‍යතා හා උවමනා පිළිබඳ අධ්‍යයනයකින් ලැබූ තොරතුරුද අනුව සන්නිවේදන සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට කටයුතු යොදයි.

ප්‍රදේශයේ සිසුන් 2000ක් පමණ අධ්‍යාපනය ලබන තෙළුම් පොකුණ මධ්‍ය මහා විද්‍යාලයට මීටර් 50ක් දුරින් මෙන්ම, මහා මාර්ගයට යාබදව පිහිටි තම නිවසේම කොටසක් මේ සඳහා තෝරා ගන්නා ලදි.

මෙම ව්‍යාපාරය "සත්සිඳු" කොමියුනිකේෂන් යනුවෙන් නම් කළ අතර, අවශ්‍ය නීතිමය අවශ්‍යතාද සම්පූර්ණ කරන ලදි.

පහත සඳහන් දෑ මිලට ගෙන ව්‍යාපාරය ආරම්භ කරන ලදි.

ෆැක්ස් යන්ත්‍රය රු. 80,000/- ණයට ලබා ගන්නා ලදි.
එකක් රු. 45,000/- බැගින් ඡායා පිටපත් යන්ත්‍ර 2 යි
ලී බඩු හා සවිකිරීම් රු. 95,000/-
දුරකථන පහසුකම් හා අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමේ වියදම් රු. 40,000/-
නිවස ඉදිරිපිට පුවරුවක් සවි කිරීම රු. 5,000/-
ව්‍යාපාරයේ දෛනික කටයුතු පවත්වාගෙන යාමට මසකට රු. 15,000/- ක වැටුපක් ගෙවීමේ පොරොන්දුව පිට සුමිත් සේවයට බඳවා ගනී.
ව්‍යාපාරය අනාගතයේදී සීමා සහිත පොදු සමාගමක් බවට පරිවර්තනය කිරීමට අදහස් කරගෙන සිටින බව සුමනවීර ප්‍රකාශ කරයි.

ඉහත සිද්ධි ඇසුරින් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. මෙම ව්‍යාපාරය
   අ) නිෂ්පාදනයේ ස්වභාවය අනුව
   ආ) අරමුණ අනුව වර්ග කිරීමේදී අයත් වන අංශ නම් කරන්න.
2. මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමේදී ඉටු කළයුතු නීතිමය අවශ්‍යතා දෙකක් ලියන්න.
3. ඉහත ව්‍යාපාරය සීමාසහිත පොදු සමාගමක් බවට පත් කිරීමෙන් ලැබිය හැකි ප්‍රතිලාභ දෙකක් ලියන්න.
4. සුමනවීරට මෙම ව්‍යාපාරය ඇරඹීමේදී වැදගත් වන බාහිර පරිසර සාධක දෙකක් ලියන්න.
5. i) සුමනවීරට ව්‍යාපාරයේ ගණුදෙණු පහසු කර ගැනීමට ආරම්භ කළහැකි බැංකු ගිණුම් වර්ගයක් නම් කරන්න.
   ii) සුමනවීරගේ ඉතිරි මුදල් ආයෝජනය කිරීම සඳහා සුදුසු දිගු කාලීන විධිමත් ආයෝජන මාර්ගයක් නම් කරන්න.

6. ඉහත ව්‍යාපාරයේ ආරම්භක දිනට මූලික ගිණුම් සමීකරණය ලියා දක්වන්න.

7. ඉහත තොරතුරු අනුව සුමනවීර යෙදූ ප්‍රාග්ධනය ගණනය කර දක්වන්න.

8. ඉහත සිද්ධියට අදාල ප්‍රාග්ධන වියදමක් සහ අයභාර වියදමක් දැක්වීමට ව්‍යාපාරය ඇසුරෙන් උදාහරණයක් බැගින් ලියා දක්වන්න.

9. පහත අවස්ථා ගිණුම්ගත වන ආකාරය ලියා දක්වන්න.
   i) ඡායා පිටපත් කොළ මිලට ගැනීම රු. 2,500/-
   ii) සුමනවීරගේ පුතාගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ඡායා පිටපත් කොළ 50 ක් ලබා ගැනීම රු. 50/-

10. ඉහත ව්‍යාපාරයේ වාර්ෂික මෙහෙයුම් ප්‍රතිඵල ගණනය කිරීම සඳහා පිළියෙල කරගත හැකි මූල්‍ය ප්‍රකාශන දෙකක් නම් කර, ඒවායින් අනාවරණය කර ගන්නා ප්‍රධාන තොරතුරක් බැගින් ද ලියන්න.
(ලකුණු 20 යි)

"අ" කොටස

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

2. i. සපත්තු නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා සකස් කළ ව්‍යාපාර සැලැස්මකින් පහත තොරතුරු ඔබට සපයා ඇත. මෙම තොරතුරු ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මාසයක් තුළ අපේක්ෂිත වියදම් :-	රු.
සම් මිලට ගැනීම	22,000.00
පොලිෂ්	1,500.00
ඇසුරුම් ද්‍රව්‍ය	5,000.00
කළමනාකරු වේතන	15,000.00
විදුලි වියදම්	3,500.00
කම්හල් කුළී	3,000.00

සපත්තු ජෝඩුවක් මැසීමේ වැඩ කුළිය රු. 100.00 කි. මාසයක් තුළ නිපදවීමට අපේක්ෂිත ඒකක ගණන 200 කි.
(අ) ඇස්තමේන්තු මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.
(ආ) සපත්තු ජෝඩුවක් නිපදවීමේ ඒකක පිරිවැය කීයද?
(ඇ) 20% ක ලාභාන්තිකයක් අපේක්ෂා කරන්නේ නම් සපත්තු ජෝඩුවක විකුණුම් මිල කොපමණද?
(ලකුණු 06)

ii. ව්‍යාපාරයක අභ්‍යන්තර හා බාහිර පරිසරය පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් අවබෝධ කරගත හැකි වැදගත් කරුණු හතරක් ලියන්න.
(ලකුණු 04)

3. i. "ව්‍යාපාර ලෝකයේ පවතින ව්‍යාපාර සංවිධාන අතුරින් බහුලව දක්නට ලැබෙනුයේ කේවල ස්වාමි ව්‍යාපාර සංවිධානයයි." මෙයට බලපා ඇති හේතු හතරක් ලියන්න. (ලකුණු 02)

ii. පහත සඳහන් ව්‍යාපාර සංවිධාන ලියාපදිංචි කිරීමේදී පදනම් කර ගන්නා පණත් නම් කරන්න.
1. සමුපකාර සමිති 2. සීමාසහිත පොදු සමාගම් (ලකුණු 02)

iii. අ) නිෂ්පාදන ඒකකයක විකුණුම් මිල තීරණය කිරීමේදී සැලකිල්ලට ගතයුතු සාධක දෙකක් ලියන්න.
(ලකුණු 01)
ආ) යම් නිෂ්පාදිතයක් පිළිබඳ අලෙවි පර්යේෂණ කිරීමට තෝරා ගන්නා පුද්ගල කණ්ඩායම හෝ ප්‍රදේශය නම් කරන්නේ කෙසේද?
(ලකුණු 01)

iv. වාණිජ බැංකුවල ණය සැපයීම සහ තැන්පතු භාර ගැනීම යන කාර්යයන් හැර, සපයන වෙනත් සේවා හතරක් ලියන්න.
(ලකුණු 02)

v. පහත දක්වෙන්නේ සන්නිවේදන මාධ්‍යයන් දෙකකි. ඒවා සඳහා නිදසුන් දෙක බැගින් දෙන්න.
අ) විද්‍යුත් ආ) සංකේත හා සංඥා (ලකුණු 02)

4. i. දේපළ රක්ෂණය සම්බන්ධයෙන් රක්ෂණ ඔප්පු ලබා ගැනීමේදී ආවරණය කරගත හැකි උවදුරු දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ව්‍යාපාර ආයතනයකට ක්‍රමවත් ගබඩාකරණයක් නොමැති වීමෙන් මුහුණ දීමට සිදුවන දුෂ්කරතා හතරක් ලියන්න. (ලකුණු 02)

iii. නුවරඑළියේ සිට කොළඹට මල් ප්‍රවාහනය කිරීමේදී මාධ්‍යයක් තෝරා ගැනීමට පෙර සලකා බැලිය යුතු කරුණු හතරක් ලියන්න. (ලකුණු 02)

iv. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයකට අරමුදල් සපයා ගත හැකි මූල්‍යය මාර්ග අතරින් දෙකකි.
අ) බැංකු ණය ලබා ගැනීම
ආ) ව්‍යාපාරයේ වත්කමක් විකිණීම
මින් එක් එක් මූල්‍යය මාර්ගයේ ඇති ප්‍රතිලාභ දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 02)

v. ආයුපාල මහතා රජයේ රැකියාවකින් විශ්‍රාම ගත් පසු ලබාගත් විශ්‍රාම පාරිතෝෂික මුදලින් කොටසක් සීමා සහිත පොදු සමාගමක සාමාන්‍ය කොටස් වල ආයෝජනය කිරීමට තීරණය කරන ලදි. ඔහුට ලැබිය හැකි ප්‍රතිලාභ 4 ක් ලියන්න. (ලකුණු 02)

"ආ" කොටස

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

5. i. සඳුන්ගේ ව්‍යාපාරයේ 2012 මාර්තු 01 දිනට මුදල් ශේෂය රු. 5,600/- ක් වූ අතර බැංකු ශේෂය රු. 12,400/- ක් විය. මාර්තු මාසයේ පළමු සතිය තුළ පහත සඳහන් ගණුදෙණු සිදුවිය.

මාර්තු 02 අත්පිට විකුණුම් රු. 8,000/- ඒ සඳහා චෙක්පතක් ලැබුණා
මාර්තු 03 මාර්තු 02 දින ලද චෙක්පත බැංකුවේ තැන්පත් කලා
මාර්තු 04 දුරකථන ගාස්තු චෙක් පතකින් ගෙව්වා 1500
මාර්තු 05 ණයගැතියකු වූ චතුරගෙන් රු. 2,000/- ක් වෙනුවෙන් රු. 1,900/- ක් ලැබුන අතර ඉතිරිය වට්ටමක් සේ සලකන ලදි.
මාර්තු 06 ණයහිමියකු වූ අනිල්ට ගෙවිය යුතු වූ රු. 2,500/- වෙනුවෙන් රු. 2,350/- ක් ගෙවීමෙන් එම ගණුදෙණුව අවසන් කරන ලදි.
මාර්තු 07 සඳුන් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 1,500/- චෙක්පතක් මාරු කර ගන්නා ලදි.

අවශ්‍ය වන්නේ

සඳුන්ගේ ව්‍යාපාරයේ තීරු තුනේ මුදල් පොතේ ඉහත සඳහන් ගණුදෙනු සටහන් කර මාර්තු 07 දිනට තුලනය කර පෙන්වන්න. (ලකුණු 06)

ii. 2012 සැප්තැම්බර් 30 දින දිනුක්ගේ ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු ශේෂය රු. 12,500/- ක් විය. එදිනට බැංකු ප්‍රකාශයේ ශේෂය මුදල් පොතේ ශේෂයට වඩා වෙනස් විය. වෙනසට හේතු පහත සඳහන් වේ.

1. බැංකු ගිණුමට හර වූ නමුත් මුදල් පොතේ සටහන් නොවූ බැංකු ගාස්තු රු. 200/- කි.
2. අසාන් සමාගමෙන් ලැබූ රු. 5,000/- ක ලාභාංශ බැංකු ගිණුමට බැරවී තිබීම.
3. සැප්තැම්බර් මාසය තුල තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 8,000/- යි.
4. සැප්තැම්බර් මාසයේ නිකුත් කළ නමුත් මුදල් ලබා ගැනීමට බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 9,500/- කි.

අවශ්‍ය වන්නේ

1. 2012.09.30 දිනට මුදල් පොත සංශෝධනය කිරීම
2. 2012.09.30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කර බැංකු ප්‍රකාශයේ පැවැති ශේෂය සොයන්න. (ලකුණු 04)

6. i. පහත සඳහන් වැරදි හා අඩුපාඩු අයත් වන ගිණුම්කරණ දෝෂය නම් කරන්න.

   ආ) ප්‍රචාරක වියදම් ලෙස ගෙවූ රු. 3,000/- ක මුදල දෙවරක් ගිණුම් ගත කිරීම.

   ආ) ගැණුම් ජර්නලය එකතු කිරීමේදී රු. 1,000/- ක් වැඩිපුර එකතු කර තිබීම හා ලැබූ වට්ටම් ගිණුම රු. 1,000/- ක් වැඩිපුර එකතු කර තිබීම.

   ii. අබ්දුල්ගේ ව්‍යාපාරයේ 2012 මාර්තු 31 දිනට සකස් කළ ශේෂ පිරික්සුම තුලනය නොවීය. එම වෙනස වූ රු. 1,010/- අවිනිශ්චිත ගිණුමේ හර පැත්තේ සටහන් කරන ලදි. පසුව පහත සඳහන් තොරතුරු අනාවරණය විය.

   i. ණයහිමියකු වූ පීරිස්ට ගෙවූ රු. 1,500/- මුදල් පොතේ නිවැරදිව ලියා ඇතත් පීරිස්ගේ ගිණුමේ සටහන් කර නැත.

   ii. විකුණුම් ජර්නලයේ එකතුව රු. 800/- ක් වැඩියෙන් එකතු කර තිබීම

   iii. ණයගැතියකු වූ සුදත්ගෙන් ලද රු. 430/- මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇතත් සුදත්ගේ ගිණුමේ සටහන් කර ඇත්තේ රු. 340/- ක් ලෙසය.

   iv. ලද වට්ටම් ගිණුමේ ශේෂය රු. 1,200/- ශේෂ පිරික්සුමට පිටපත් කර නැත.

   අවශ්‍ය වන්නේ

   1. මෙම වැරදි නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන්

   2. අවිනිශ්චිත ගිණුම තුලනය කර පෙන්වීම (ලකුණු 10)

7. 2012.03.31 දිනට සත්සර ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

	හර (රු.)	බැර (රු.)
ප්‍රාග්ධනය		260,000
බඩු තොගය 2011.04.01 දිනට	12,000	
ගැණුම්	62,000	
විකුණුම්		95,000
15% බැංකු ණය		50,000
ණයගැතියෝ	20,000	
ණයහිමියෝ		13,000
මෝටර් රථ	100,000	
මෝටර් රථ ක්ෂය වෙන් කිරීම (2011.04.01 දිනට)		10,000
ඉඩම් හා ගොඩනැගිලි පිරිවැයට	200,000	
ආපසු යැවුම්		2,000
ආපසු එවුම්	3,000	
වරිපණම්	7,000	
රක්ෂණය	8,000	
දුන් වට්ටම්	2,000	
ලැබූ වට්ටම්		3,000
බැංකු ණය පොළී	5,000	
විකුණුම් සේවක වේතන	4,000	
අතැති මුදල්	10,000	
	433,000	433,000

අමතර තොරතුරු

- 2012.03.31 දිනට බඩු තොගය රු. 20,000 කි.
- මෝටර් රථ 10% බැගින් සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව ක්ෂයකළ යුතුයි.
- ඉදිරියට ගෙවා ඇති රක්ෂණය රු. 1,000/- ක් වන අතර ගෙවිය යුතු වරිපනම් රු. 500/- කි.
- ණයගැතියන්ගෙන් රු. 2,000/- ක් බොල්ණය ලෙස කපා හරින්න.

අවශ්‍ය වන්නේ

01. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම

02. 2012.03.31 දිනට ශේෂ පත්‍රය (ලකුණු 10)